# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2463/06 - 2025 නොවැම්බර් මස 17 වැනි සඳුදා - 2025.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

සභික ධුරය අතහැර යාම හේතුකොට ගෙන මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ අංක 09 කෝට්ටෙයිකල්ලාර් කොට්ඨාසයට තේරී පත්වූ දරුමරෙත්තිනම් සුදාකරන් අයත් වන්නා වූ තමිළ් මක්කල් විඩුදලෛප් පුළිකල් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ අංක 09 කෝට්ටෙයිකල්ලාර් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා නිරෝජිනි කලෙයිවාණන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි නාගලිංගම් රේගන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් නිරෝජිනි කලෙයිවාණන් මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ අංක 09 කෝට්ටෙයිකල්ලාර් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එන්. රේගන්,**
තේරීම්භාර නිලධාරි,
මන්මුනෙයි දකුණ සහ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව.

2025 නොවැම්බර් මස 17 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 11 - 0125


1A - PG 7355 — 08 (2025/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*